රාජකීය විද්‍යාලය කොළඹ 07
# Royal College Colombo 07

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
## Grade 13 – Final Term Test June 2010

කාලය: පැය 2

## කෘෂි විද්‍යාව I

- **සියලුම ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන්න.**

1) පාසල් කාලගුණික මධ්‍යස්ථානයකදි සාපේක්ෂ ආර්ද්‍රතාවය මනිනු ලබන්නේ,
   1. තෙත් හා වියළි බල්බ උෂ්නත්ව මානයෙකි.
   2. වාෂ්පීකරණ තැටියකිනි
   3. පීඩනමානයකිනි.
   4. PH මීටරයෙනි.
   5. ආතතිමානයකිනි.

2) ජල චක්‍රයට අවම බලපෑමක් ඇති කරනුයේ,
   1. මුහුදු ජලයෙනි.
   2. භූගත ජලයයි.
   3. වායුගෝලයේ ජල වාෂ්පයි.
   4. ග්ලැසියරයි.
   5. මතුපිට ඇති මිරිදියයි.

3) බීජ ජලය අවශෝෂනය කරනු ලබන්නේ,
   1. බීජාග්‍රපයෙනි.
   2. බීජ මූලයෙනි.
   3. බීජ ලපයෙනි.
   4. සේවනියෙනි.
   5. අනුද්වාරයෙනි.

4) 2007 වර්ෂයේ දළ දේශි නිෂ්පාදනයට 2002 සහතික මිල අනුව කෘෂිකාර්මික අංශයෙන් ලැබූ දයකත්වය ආසන්න වශයෙන්
   1. 8 % කි.
   2. 10 % කි.
   3. 12 % කි.
   4. 14 % කි.
   5. 16 % කි.

5) වියළි කලාපයේ පස් වල රතු වර්ණය බොහෝ විට ඇති වන්නේ
   1. යකඩ ඔක්සයිඩ නිසාය.
   2. කෙඔලිනයිට් ඛනිජ නිසාය.
   3. සිලිකේට ඛනිජ නිසාය.
   4. අධික මැටි ප්‍රමානය නිසාය.
   5. බොරලු නිසාය.

6) ක්ෂුද්‍ර ප්‍රචාරනය,
   1. අනෙකුත් ප්‍රකට ප්‍රචාරණ ක්‍රමවල වඩා වියදම අඩුයි.
   2. දෛහික ක්ලෝන විචලතාව දක්වයි.
   3. කුඩා බීජ සහිත බෝග ප්‍රචාරණය සඳහා වඩාත් සුදුසුයි.
   4. විශාල වශයෙන් ශ්‍රමය අවශ්‍ය වේ.
   5. වෛරස රහිත රෝපණ ද්‍රව්‍ය ලබා ගැනිම සඳහා භාවිතා වේ.

7) ලණු ගෘහ (Lath House) ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නේ
   1. විශාල බීජ ප්‍රරෝහණය කිරීමටය.
   2. රෝග හා පළිබෝධ වලින් ආරක්ෂා කර ගැනීමටය.
   3. කැපු මල් කර්මාන්තයේ දී මල් පිපීම ආරම්භ කිරීමටයි.
   4. දඬු කැබලි වලින් මුල් ඇද්දවීම පිණිසය.
   5. පත්‍රමය ශාක පුහුණු කිරීමටය.

8) පසු අස්වනු හානි අවම කළ හැකි වනුයේ,
   A. නිසි අවධියේදී අස්වනු නෙලීමෙනි.
   B. අස්වැන්න වර්ග කිරීමෙනි.
   C. නිසි ඇසුරුම් ද්‍රව්‍ය භාවිතයෙනි.
   D. ගොවිපලේදීම විකිණීමෙනි.

   වඩාත් නිවැරදි ප්‍රකාශ වනුයේ,
   1. A හා B පමණි
   2. B හා C පමණි
   3. C, හා D පමණි
   4. A, B හා C පමණි
   5. A, B, C හා D සියල්ලම.

9) පස් පැතිකඩක O ($A_0$) ස්ථරය,
1. පිහිටා ඇත්කේ A ස්ථිරය ලඟව ඊට පහළින්ය.
2. පිහිටා ඇත්තේ R ස්ථිරය ලඟව ඊට ඉහළින්ය.
3. මාතෘ පාෂාණ ද්‍රව්‍ය වලින් සෑදී ඇත.
4. සමහර පස් වල ඉහළින්ම පිහිටා ඇති ස්ථරය
5. සමහර අවස්ථා වලදී E ස්ථරය ලෙස හැඳින් වේ.

10) පසක ජලය දරා ගැනීමේ ධාරිතාව ප්‍රධාන වශයෙන් නිර්ණය වනුයේ එම පසෙහි,
1. අඩංගු අංශු වල ප්‍රමාණය මගිනි.
2. ඇති මූල කේශ ප්‍රමාණය මගිනි.
3. අයන හුවමාරු ධාරිතාව මගිනි.
4. ඇති ක්ෂුද්‍ර ශාක ප්‍රමානය මගිනි.
5. PH අගය මගිනි.

11) පාලනයට ඉතා අපහසු වල් පැලෑටි කාණ්ඩය වනුයේ,
1. වාර්ෂික වල් පැළෑටිය.
2. ද්විවාර්ෂික වල් පැළෑටිය.
3. සරල බහු වාර්ෂික වල් පැළෑටිය.
4. සංකිර්ණ බහු වාර්ෂික වල් පැළෑටිය.
5. ඒක වාර්ෂික වල් පැළෑටිය.

**අංක 12,13 හා 14 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන බීජයක රූප සටහන උපයෝගි කර ගන්න.**

12) කලලයේ කොටස් වනුයේ,
1. A, B, හා C පමණි.
2. B, C හා D පමණි
3. A, B C, හා D පමණි .
4. C, D හා E පමණි
5. C, D, E හා F පමණි .

13) මාතෘ පටකයේ කොටසක් වනුයේ,
1. A 2. B 3. C 4. D 5. E

14) බීජයේ ත්‍රිගුණ (3n) පටකය වනුයේ,
1. A 2. B 3. C 4. D 5. E

15) බෝග මාරුවකදී ගොවියෝ බොහෝ විට ධාන්‍ය බෝග සමඟ රනිල බෝග මාරුවෙන් මාරුවට වවති. එයට හේතුව රනිල බෝග.
1. හොඳින් වැඩී පසට විශාල වශයෙන් කාබනික ද්‍රව්‍ය එක් කිරීමය.
2. පසේ නයිට්‍රජන් මට්ටම වැඩි කිරීමය.
3. ඉහළ ප්‍රභාසංස්ලේෂන වේගයකින් යුක්ත වීමය.
4. P හා K පොහොර අඩුවෙන් භාවිතා කිරීමය.
5. මානුෂ්‍ය පෝෂනයට වඩාත් හිතකර ඇවයිනෝ අම්ල සංයුතියෙන් යුත් ප්‍රෝටීන සහිත විමය.

16) ආර්ද්‍රතාව සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. පරිමණ්ඩික (අවට) උෂ්නත්වය වැඩිවීම සමඟ ආර්ද්‍රතාව වැඩිවේ.
2. උදෑසන කාලයේ ආර්ද්‍රතාව සාමාන්‍යයෙන් මධ්‍යාහ්නයේ ආර්ද්‍රතාවයට වඩා වැඩිය.
3. ආර්ද්‍රතාවය උන්නතාංශය සමඟ වෙනස් නොවේ.
4. ශාකාගාර තුල ආර්ද්‍රතාව පිටත ආර්ද්‍රතාවට ඩා සාමාන්‍යයෙන් අඩුය.
5. ඉහළ ආර්ද්‍රතාව සාමාන්‍යයෙන් පරාගනයට හිතකරයි.

17) තැනිතලා පිටාර තැන්නක, හෂ්ම සංතෘප්තතාව 60 % 90 % කි. වු අළු පැහැති පසක් දක්නට ලැබිණ. මෙය වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ,
1. Low humic gley පසක් ලෙස,
2. අපරිණත දුඹුරු ලෝම පසක් ලෙසය.
3. Grumusols පසක් ලෙසය.
4. Solodized Solenetz පසක් ලෙසය.
5. දියළු පසක් ලෙසය.

18) කෙටි කාලීනව, නිමැයුම සමඟ විචලතා නිරීක්ෂනය කල හැක්කේ,
1. කෙටි කාලින වියදම් වලය.
2. ප්‍රාග්ධන වියදම් වලය.
3. ස්ථාවර වියදම් වලය.
4. ආන්තික වියදම් වලය.
5. විචල්‍ය වියදම් වලය.

19) වෙළඳපොල ඉල්ලුම බලපාන සාධක අතර උපයෝගිතාවය පිළිබඳ සංකල්පයෙන් විස්තර වන්නේ,
1. මිල සම්බන්ධතාවය.
2. පාරිභෝගික රුචිය.
3. අනෙක් භාණ්ඩ වල මිල.
4. අනෙක් භාණ්ඩ වල සැපයුම.
5. අනෙක් භාණ්ඩ වල ඉල්ලුම

20) සුප්තතාව පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.
A. බීජවල ඇතිවේ.
B. බල්බ වල හා අංකුර වල ඇතිවීමට ඉඩ ඇත.
C. අහිතකර පරිසර තත්වලින් බේරීමට බීජ වලට උපකාරී වේ.
D. ගොවිපලේදීම විකිණීමෙනි.
වඩාත් නිවැරදි ප්‍රකාශ වනුයේ,
1. A පමණි 2. A හා B පමණි 3. A, හා C පමණි
4. B හා C පමණි 5. A, B, හා C සියල්ලම.

21) එක්තරා ශාක හෝමෝර්නයක්, සෛල දික්වීම, සෛල විභාජනය, මුල් ඇතිවීම, පුෂ්පීකරණය සහ අග්‍රස්ථ ප්‍රමුඛතාව ප්‍රවර්ධනය කරයි. මෙම හෝමෝර්නය,
1. ඔක්සින් වේ. 2. ගිබරලින් වේ. 3. සයිටොකයිනින් වේ.
4. ඇබ්සිසික් අම්ලය වේ. 5. එතිලීන් වේ.

22) $4^0$C උෂ්නත්වයකදී යෝගට් ගබඩා කර තබාගත හැකි කාලය
1. දින 2 4 පමණ වේ. 2. දින 5 7 පමණ වේ. 3. දින 7 10 පමණ වේ.
4. සති 2 ක් පමණ වේ. 5. මාස 1 පමණ වේ.

23) අර්ධ ජලජ ආක්‍රමණික ශාකයකට උදහරණයකි.
1. Salvinia molesta 2. Eichhormia crassipes 3. Pistia ataratotes
4. Mimosa pigra 5. Lantana camar

24) පරාගනය යනු,
1. පරාගධානියේ සිදුවන ඌනන විභාජනය වේ.
2. කලංකය මත පරාග කනිකා තැන්පත් වීම වේ.
3. කලංකය මත පරාග කනිකා පුරෝහනය වීම වේ.
4. පුං න්‍යෂ්ටිය මගින් ඩිම්බය සංස්චනය වීම වේ.
5. සංසේචිම ඩිම්බය, කලලය බවට වර්ධනය වීම වේ.

25) අවම බිම් සැකසීම වඩාත් සුදුසු වනුයේ,
1. අපිභෞම ප්‍රරෝහනයක් සහිත බෝග වලටය.
2. අධෝභෞම ප්‍රරෝහනයක් සහිත බෝග වලටය.
3. කුඩා බීජ සහිත බෝග වලටය.
4. විශාල බීජ සහිත බෝගවලටය.
5. තද බීජාවරණයක් සහිත බෝග වලටය.

26) වාරි ජල සැපයුමක ප්‍රමානය හා වාර ගණන ගණනය කිරීමේදි සලකන ලද සාධක පහත දැක්වේ.
A. ශාක මුලෙහි ගැඹුර
B. මුලේ ගැඹුර තුළ ඇති පසෙහි ජලය රඳ පවතින කාලය
C. ශාකයේ පාරිභෝගික ජල භාවිතාව
D. ලබාගත හැකි වාරි ජල ප්‍රමානය
ඉහත සාධක අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ වනුයේ,
1. A හා B පමණි 2. A, B හා C පමණි 3. A, B, හා D පමණි
4. B, C හා D පමණි 5. A, B, C හා D යන සියල්ලම.

27) කෘෂි වන වගා පද්ධතියකට උදහරණයක් වනුයේ,
1. සෙවන ශාක සහිත තේ වගාවක්. 2. පහතරට එළවළු වගාවක්. 3. උඩරට එළවළු වගාවක්.
4. රබර් වගාවක්. 5. සම්ප්‍රදායික උඩරට ගෙවතු වගාවක්

28) බෝර්ඩෝ මිශ්‍රණය යනු,
1. පටක රෝපන මාධ්‍යයකි. 2. පොහොර මිශ්‍රනයකි. 3. දිලීර නාශකයකි.
4. කෘමිනාශකයකි. 5. පංශු ආකලනයකි.

29) අනුපූරක සාධක ප්‍රවේනියෙහි F, පරම්පරාවෙහි රූපානු දර්ශ අනුපාතය වනුයේ,
1. 9 : 7 2. 15 : 1 3. 13 : 3 4. 9 : 6 : 1 5. 12 :3 : 1

30) පහත දක්වෙන දිස්ත්‍රික්ක අතුරෙන් වැඩිම ජනගහනයක් ඇති දිස්ත්‍රික්ක මොනවාද ?
1. කොළඹ, ගම්පහ, කුරුණෑගල 2. ගාල්ල, කොළඹ, කුරුණෑගල
3. කොළඹ, ගාල්ල, නුවර 4. රත්නපුර, කුරුණෑගල, කොළඹ
5. කොළඹ, ගාල්ල, ගම්පහ

31) අපනයන දශකය ලෙස හඳුන්වනු ලබන්නේ
1. 1992 2002 2. 1990 2000 3. 1995 2005 4. 1998 2008 5. 1991 2001

32) නිෂ්පාදන ප්‍රමාණය x ඒකක මිල මගින් ලැබෙනුයේ
1. ආන්තික ආදායම 2. මුළු ආදායම
3. සාමන්‍ය ආදායම 4. මුළු ලාභය
5. සාමාන්‍ය ලාභය

33) සහල් නිෂ්පාදනයේ පසු අස්වනු තාක්ෂණය ක්‍රියාවලියේ දී වැඩිම අස්වනු හානියක් සිදුවන්නේ,
1. ඇසුරුම්කරණයේදීය 2. පැහීමේදීය
3. ගබඩාකිරීමේදිය 4. තැම්බීමේදීය
5. කෙටීමේදීය

34) සින්ක් ( Zinc)
1. අත්‍යවශ්‍ය මහා මූලද්‍රව්‍යයකි. 2. අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රවයකි.
3. අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයකි. 4. ශාකවල විෂ ද්‍රව්‍යයකි.
5. ජිප්සම් වල අඩංගු ද්‍රව්‍යයකි

35) සෝයා බෝංචි අන්නයේ අඩංගු සාමාන්‍ය දළ ප්‍රෝටීන ප්‍රමාණය
1. 20% 22 % 2. 30% 33 % 3. 40% 44 %
4. 50% 55 % 5. 60% 66%

36) Azariachtin, Nim binsalanmin, Meliantriol හා Nimbidin අඩංගු වනුයේ,
1. කෝමාරිකා වලය 2. දුම්කොළ වලය 3. කොහොඹ වලය
4. කහ වලය 5. මදුරුතලා වලය

37) ද්විවාර්ෂික වල් පැල මර්දනයට වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
1. වර්ෂාකාලය ආරම්භ වීමට පෙර වල් පැළ පිලිස්සීමය.
2. බෝග සිටවීමට පෙර ස්පර්ශ වල්නාශක යෙදීමය.
3. බිම් සැකසීමට පෙර වල් නැසීමය.
4. වල් පැළවල ජීවන චක්‍රයේ පළමු වර්ෂයේද ගලවා දැමීමය.
5. ඉහත සඳහන් කිසිවක් නොවේ.

38) මාරක සාධක ප්‍රවේනියේදී F2 ප්‍රජනිකයෙහි අපේක්ෂිත රූපානුදර්ශක අනුපාතය
1. 2 : 1 වේ. 2. 3 : 1 වේ. 3. 9 : 7 වේ
4. 13 : 3 වේ 5. 15 : 1 වේ

39) පැළ කීඩැවා අයත් ශ්‍රෝතය
1. ඩමෙප්ටෙරා වේ. 2. ඩික්ටියොප්ටෙරා වේ.
3. ඕතොප්ටෙරා වේ. 4. හෙටරොප්ටෙරා වේ.
5. හෝමොප්ටෙරා වේ.

40) එක්තරා ප්‍රදේශයක, එක්තරා දිනයක වර්ෂාපතනය 7 cm වේ. විෂ්කම්භය 10 cm වු වර්ෂාපතනය එකතු වු ජල පරිමාව වනුයේ,
1. 55.68 $cm^3$ 2. 220 $cm^3$ 3. 440 $cm^3$ 4. 550 $cm^3$ 5. 2200 $cm^3$

41) කිකිළි බිත්තරයන බීජෞෂන කාලය
1. දින 36 කි. 2. දින 21 කි. 3. දින 24 කි. 4. දින 28 කි. 5. දින 30 කි.

42) පරිසර උෂ්නත්වය වැඩි වු විට
A. එළදෙනුන්ගේ ආහාර ආගනුව අඩුවේ.
B. ඌරන්ගේ ජල ආගනුව වැඩිවේ.
C. කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය අඩුවේ.
ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වනුයේ,
1. A පමණි 2. B පමණි 3. B, හා C පමණි 4. A, B, හා C සියල්ලම.
5. ඉහත කිසිවක් නොවේ.

43) ප්‍රෙජෙස්ටෙරොන් ප්‍රධාන වශයෙන් ස්‍රාවය වනුයේ,
1. බුරුල්ලේන්ය. 2. ඩිම්බ ප්‍රනාල වලය. 3. ගර්භාෂයේය. 4. වෘෂණ වලය.
5. පීතදේහයේය.

44) එළකිරි වලින් මී කිරි පහසුවෙන් වෙන්කර හඳුනා ගත හැක්කේ, මී කිරි
1. සුදු පැහැ වීම හා අඩු මේද ප්‍රමානයක් තිබීමෙනි.
2. කහ පැහැ වීම හා අඩු මේද ප්‍රමානයක් තිබීමෙනි.
3. සුදු පැහැ වීම හා වැඩි මේද ප්‍රමානයක් තිබීමෙනි.
4. කහ පැහැ වීම හා වැඩි මේද ප්‍රමානයක් තිබීමෙනි.
5. විශේෂිත ගන්ධයක් සහිත නිසාය.

45) දළ ආහාර වල,
1. 18 %වැඩියෙන් දළ තන්තු අඩංගු වේ.
2. 18 % අඩුවෙන් දළ තන්තු අඩංගු වේ.
3. 20 % වැඩියෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.
4. 20 % අඩුවෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.
5. 20 % වැඩියෙන් දළ තන්තු හා දළ ප්‍රෝටීන අඩංගු වේ.

46 ) බීජ සුප්තතාවය බිඳිය හැක්කේ,
1. ආමු කුලනනෙි.
2. බීජ දුවටීමෙනි
3. සීරීමෙනි
4. ජීවානුහරණය කිරීමෙනි.
5. පිරිසිදු කිරීමෙනි.

47) කෙටි දින ශාක වල මල් හට ගන්නේ දිවා කාලයේ දිග
1. අවධි කාලයට වඩා දිගු වූ විටය.
2. අවධි කාලයට වඩා කෙටි වූ විටය.
3. පැය 12 කට වඩා දිගු වූ විටය.
4. පැය 12 කට වඩා කෙටි වූ විටය.
5. පැය 12 ට සමාන වූ විටය.

48) රෝමාන්තිකයකුගේ රූමනය තුල අධික ලෙස වාතය එක් රැස් වීම නිසා හටගන්නා රෝගී තත්වය නම්,
1. ඇගලෙක්ටියයි.
2. පිපුමයි (bloat)
3. කුර හා මුඛ රෝගයයි.
4. නිවුමෝනියාවයි.
5. කිරි උණයි.

49) ලාභ අලාභ ගිනුම සකසනු ලබන්නේ
1. යම් නියත දිනයකටය.
2. වසරකටය.
3. යම් නිශ්චිත කාලයකටය.
4 යම් නියත මසකට
5. කාලය කිව නොහැක.

50) වසු පැටවකුගේ අග්න්‍යාශයේ ස්‍රාවය වන ප්‍රධාන ප්‍රෝටීන ජීර්ණ එන්සයිමය,
1. ට්‍රිප්සින්
2. කයිමෝට්‍රිප්සින්
3. පෙප්සින්
4. රෙනින්
5. ශ්ලේෂ්මලය.

51) කිකිළයකගේ ගොජුර, ආහාර
1. පැසීම සිදුවන ස්ථානය වේ.
2. ගබඩා වන ස්ථානය වේ.
3. රසායනික ජීර්ණය සිදුවන ස්ථානය වේ.
4. යාන්ත්‍රික ජීර්ණය සිදුවන ස්ථානය වේ.
5. ජීර්ණය හා අවශෝෂනය සිදුවන ස්ථානය වේ.

52) බෝගයක ඉහළම බෝග සංගුනකය දක්නට ලැබෙනුයේ එම බෝගයේ,
1. පැළ අවස්ථාවේදීය
2. ක්‍රියාකාරී වර්ධක අවස්ථාවේදීය
3. ප්‍රජනක අවස්ථාවේදීය
4. පරිනත අවස්ථාවේදීය
5. පැළ හා පරිනත යන අවස්ථාවලදීය

53) පත්‍රවල ඇත්තොසයනීන් වර්නකය වර්ධනය වීම දක්නට ලැබෙන්නේ
1. N ඌනතාවය නිසාය.
2. Zn ඌනතාවය නිසාය.
3. Mg ඌනතාවය නිසාය.
4. P ඌනතාවය නිසාය.
5. Ca ඌනතාවය නිසාය.

54) සුක්ෂම එළවළු බෝග වගා කරන බිමක ඇති ප්‍රධාන භූගත ජල දූෂණකාරක වනුයේ,
1. පොස්පේට් සහ පළිබෝධනාශක වේ.
2. පළිබෝධනාශක හා නයිට්රේට වේ.
3. ඇමෝනියම්, නයිට්‍රජන් හා පොස්පේට් වේ.
4. කැල්සියම් හා පොස්පේට් වේ.
5. ක්ෂුද්‍ර මුල ද්‍රව්‍ය වේ.

55) මේද ද්‍රව්‍ය විටමින් වනුයේ
1. A, B, C සහ D ය.
2. A, C, D සහ E ය.
3. C, E ,D, සහ K ය.
4. B, D, E සහ K ය.
5. A, D, E, සහ K ය.

56) බහුලව යොදා ගන්නා කෘෂිකාර්මික බෝග බොහොමයක් සඳහා උචිත පාංශු PH පරාසය වනුයේ,
1. 4 : 5 ට අඩු වීමය. 2. 4 .5 හා 6.5 අතර වීමය 3. 6.5 හා 7.0 අතරවීමය
4. 7.0හා 8.0 අතර වීමය. 5. 8.0 ට වැඩි වීමය.

57) බෑවුම් සහිත භූමියක සමෝච්ච රේඛා සටහන් කිරීමට වඩාත් උචිත උපකරණය වනුයේ
1. දම්වැල 2. U නළය 3. A රාමුව
4. මනින පටිය 5. ප්ලැනිමීටරය

58) රජයේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථාන වනුයේ
1. පොළොන්නරුව, කුන්ඩසාලේ, තින්නවේලි.
2. පොළොන්නරුව, කුන්ඩසාලේ, යාපනය
3. මහනුවර, කුන්ඩසාලේ, තින්නවේලි.
4. නුවරඑළිය, කුන්ඩසාලේ, තින්නවේලි.
5. නුවරඑළිය, කුන්ඩසාලේ, යාපනය

59) ගොවිපල නිෂ්පාදනය වැඩි කිරීමේදී ඒ සඳහා වන සාමාන්‍ය ස්ථාවර වියදම,
1. ක්‍රමයෙන් වැඩි වී ඉන්පසු අඩු වීමට පටන් ගනියි.
2. ක්‍රමයෙන් අඩු වී ඉන්පසු වැඩි වීමට පටන් ගනියි.
3. මුළු ස්ථාවර ව පවතී.
4. මුළු ස්ථාවර වියදමට සමාන්තරව වෙනස් වේ.
5. ක්‍රමයෙන් අඩු වේ.

60) එක්තරා ප්‍රදේශයක වගා කර ඇති බෝංචි බෝගයක දෛනික වාෂ්පිකරණ උත්ස්වේදනය 2mm වේ.
එම ප්‍රදේශයක හෙක්ටයාර 1 ක (1 Hec) බෝංචි වගාවකට දිනපතා යෙදිය යුතු අවම ජල පරිමාව වනුයේ,
1. 0.02 $m^3$ 2. 0.20 $m^3$ 3. 2.00 $m^3$ 4. 20.00 $m^3$ 5. 200.00 $m^3$